ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

කළමනාකරණ අධ්‍යයන පීඨය

කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය

**AFU4571 - පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණය**

අවසන් පරීක්ෂණය - **2024/2025**

කාලය : පැය තුන (03) යි

---

දිනය: **2025.06.22** මුළු ලකුණු: **100** වේලාව: පෙ.ව. **09.30** - ප.ව. **12.30**

---

උපදෙස් :

- මුළු ප්‍රශ්න ගණන පහ (05) කි.
- ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයක් අවසානයේම එයට අදාල ලකුණු සඳහන් කොට තිබේ.
- සියළුම පෙරවැඩ පැහැදිලිව පෙන්වන්න.
- සෑම පිළිතුරක්ම අළුත් පිටුවකින් ආරම්භ කරන්න.
- වැඩසටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.
- පිටු ගණන හය (06) කි.

---

ප්‍රශ්න අංක **01**

(අ) දියත එන්ටර්ප්‍රයිස් විසින් එහි නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිතා කරන "X" නම් තොග අයිතමයක් පිළිබඳ විස්තර පහත පරිදි ඔබ වෙත සපයා ඇත.

මාසික පරිභෝජනය - උපරිමය ඒකක 1,000 සහ අවමය ඒකක 200

පොරොත්තු කාලය - උපරිමය මාස 12 සහ අවමය මාස 4

වරකට ඇණවුම් කරනු ලබන ප්‍රමාණය - ඒකක 5,000 කි.

අවශ්‍ය වන්නේ,

"X" නම් තොග අයිතමයට අදාළව පහත දැක්වෙන තොග මට්ටම් ගණනය කරන්න.

i. නැවත ඇණවුම් කිරීමේ මට්ටම
ii. උපරිම තොග මට්ටම
iii. අවම තොග මට්ටම
iv. සාමාන්‍ය තොග මට්ටම

**(ලකුණු 10)**

(ආ) කාන්තා අත් බෑග් නිෂ්පාදන කරන ඩේසි බෙල්ස් පෞද්ගලික සමාගමෙහි අත් බෑග් නිෂ්පාදනයට අදාළව උපුටා ගත් තොරතුරු පහත දැක්වේ.

වාර්ෂික ඉල්ලුම ඒකක 60,000 කි. ඒකකයක් ඇණවුම් කිරීමේ පිරිවැය රු. 60/- ක් වන අතර ගබඩා කිරීමේ සහ රඳවා ගැනීමේ පිරිවැය - ඒකක පිරිවැයෙන් 20% කි. ඒකකයක පිරිවැය රු. 100/- කි.

ඉහත කරුණු මත පදනම්ව පහත දෑ ගණනය කරන්න,

i. ආර්ථික ඇණවුම් ප්‍රමාණය.

ii. ප්‍රශස්ත වාර්ෂික ඇණවුම් සංඛ්‍යාව.

**(ලකුණු 05)**

(ඇ) විවිධ වර්ගයේ භාණ්ඩ වෙළඳාමෙහි නියුතු Green Harvest නම් වූ සුපිරි වෙළඳසැලක් තොග අගය කිරීම සඳහා භරිත සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමය භාවිතා කරයි. 2025 මැයි මාසයේ පළමු සති දෙක තුළ "Bliss Bite Biscuits" නම් පරිභෝජන අයිතමයකට අදාළ ලැබීම් සහ නිකුත් කිරීම් පහත දක්වා ඇත.

| *ලැබීම්* | *දිනය* | *ඒකක සංඛ්‍යාව* | *ඒකකයක පිරිවැය (රු.)* |
|---|---|---|---|
| පළමු සතිය | 2 | 1000 | 30 |
| | 4 | 800 | 28 |
| දෙවන සතිය | 9 | 2000 | 35 |
| | 11 | 1500 | 39 |
| *නිකුත් කිරීම්* | *දිනය* | *ඒකක සංඛ්‍යාව* | |
| පළමු සතිය | 3 | 500 | |
| | 5 | 600 | |
| දෙවන සතිය | 10 | 800 | |
| | 13 | 800 | |

අවශ්‍ය වන්නේ,

"ගබඩා තොග ලෙජරය" සකස් කර 2025 මැයි මස දෙවන සතිය අවසානයේ " Bliss Bite Biscuits" නම් අයිතමයේ තොග ප්‍රමාණය සහ තොග පිරිවැය ගණනය කරන්න. **(ලකුණු 10)**

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක 02**

(අ) Floral Essence නම් පෞද්ගලික සමාගම නුවරඑළියේ මල් වගා කිරීමේ නියුතුව සිටී. එහි ස්ථිර සේවකයන් පස්දෙනා ක්ෂේත්‍ර කාර්යයන් වල යෙදී සිටිති. 2025 මැයි මාසය සඳහා ඔවුන්ගේ වැටුප් හා වේතන වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

i. මාසය තුළදී වැඩ කළ පැය ගණන

| සේවක අංකය | සේවකයාගේ නම | පැය ගණන |
|---|---|---|
| A25 | ඇන් ලී | 120 |
| A43 | මාර්ක් හිල් | 160 |
| A52 | එමා ක්ලාර්ක් | 190 |
| A61 | ටොම් රීඩ් | 150 |
| A70 | ලූසී ග්‍රීන් | 140 |

ii. සේවකයෙකුට මසකට වැඩකළ හැකි උපරිම පැය ගණන පැය 190 කි.

iii. පැයක මූලික වැටුප රු. 300/- කි. අතිකාල දීමනා ගෙවනු ලබන්නේ මූලික වැටුප් අනුපාතයෙන් 150% බැගිනි.

iv. EPF සඳහා සේවකයාගේ දායකත්වය 10% ක් වන අතර සේවා යෝජකයාගේ දායකත්වය EPF සඳහා 15% ක් සහ ETF සඳහා 3% ක් වේ.

v. සෑම සේවකයෙකුටම මසකට රු. 2,500/- ක ප්‍රවාහන දීමනාවක් ලබා දේ.

vi. සියලුම සේවකයින් මසකට රු. 200/- බැගින් සුභසාධක සංගමයට දායක වේ.

vii. මාර්ක් හිල් මහතා පැය 10 ක් අතිකාල ලෙස වැඩ කර ඇත.

viii. සිය මාසික ණය වාරිකය වන රු. 3,000/- තම වැටුපෙන් අඩු කර බැංකුවට යවන ලෙස එමා ක්ලාක් මෙනවිය ලිඛිත ඉල්ලීමක් කර ඇත.

අවශ්‍ය වන්නේ,

2025 මැයි මාසය සඳහා වැටුප් ලේඛණය පිළියෙල කරන්න. **(ලකුණු 10)**

(ආ) 2025 මැයි මාසය සඳහා වූ පහත සඳහන් පිරිවැය තොරතුරු Prime Edge Solutions Enterprises හි කර්මාන්තශාලාවට අදාළ වේ. එය නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන තුනක් සහ සේවා පිරිවැය මධ්‍යස්ථාන දෙකකින් සමන්විත වේ.

- ගොඩනැගිලි කුලී වියදම් රු. 30,000.
- වරිපනම් රු. 5,000
- විදුලිය - විදුලි පහන් සඳහා රු. 10,000 සහ යන්ත්‍ර සඳහා රු. 30,000.
- යන්ත්‍ර ක්ෂය රු. 20,000
- යන්ත්‍ර රක්ෂණය රු. 4,000
- අධීක්ෂණ වියදම රු. 8,000
- ආපනශාලා වියදම රු. 6,000

| විස්තරය | එකතුව | නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන | | | සේවා පිරිවැය මධ්‍යස්ථාන | |
|---|---|---|---|---|---|---|
| | | A | B | C | ගබඩා | නඩත්තු |
| භූමි ප්‍රමාණය (වර්ග අඩි) | 3,000 | 900 | 700 | 600 | 400 | 400 |
| යන්ත්‍ර වටිනාකම (රු.) | 600,000 | 200,000 | 150,000 | 150,000 | 40,000 | 60,000 |
| සේවකයින් ගණන | 24 | 6 | 8 | 4 | 4 | 2 |
| යන්ත්‍ර ධාරිතාව (අශ්ව බල) | 90 | 25 | 23 | 20 | 10 | 12 |

අවශ්‍ය වන්නේ,

ඉහත තොරතුරු මත පදනම්ව පොදුකාර්යය විභජන පත්‍රිකාව සකස් කරන්න. **(ලකුණු 15)**

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක 03**

(අ) ලාභ පරිමා විශ්ලේෂණයේ (**CVP**) මූලික උපකල්පන හතරක් (**04**) සඳහන් කරන්න. **(ලකුණු 04)**

(ආ) Titan Craft PLC විසින් A, B සහ C යනුවෙන් භාණ්ඩ තුනක් නිෂ්පාදනය කරයි. වර්තමානයේ, A සහ C භාණ්ඩය ලාභදායී වන අතර, පහත දැක්වෙන පරිදි B භාණ්ඩය පාඩු ලබයි. මේවායින් ලැබෙන වර්තමාන වාර්ෂික ශුද්ධ ලාභය/අලාභය පහත පරිදි වේ.

| | A (රු.) | B (රු.) | C (රු.) | මුළු වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| විකුණුම් | 50,000 | 40,000 | 60,000 | 150,000 |
| විචල්‍ය පිරිවැය | 30,000 | 25,000 | 35,000 | 90,000 |
| ස්ථාවර පිරිවැය | 17,000 | 18,000 | 20,000 | 55,000 |
| ලාභය/අලාභය | 3,000 | (3,000) | 5,000 | 5,000 |

මේ අනුව සමාගම මේ වන විට B නිෂ්පාදනය දිගටම කරගෙන යා යුතුද නැද්ද යන්න සලකා බලමින් සිටී.

අවශ්‍ය වන්නේ,

*i.* B නිෂ්පාදනය නතර කළ යුතුද නැද්ද යන්න තීරණය කරන්න **(ලකුණු 12)**

*ii.* කෙසේ වෙතත්, B නිෂ්පාදනය නැවැත්වීමෙන් ජනිත වන සම්පත්, රුපියල් 50,000 කට අලෙවි වන සහ රුපියල් 30,000 ක විචල්‍ය පිරිවැයක් සහ රුපියල් 6,000 ක අමතර ස්ථාවර පිරිවැයක් දැරීමට සිදුවන B-plus නම් නව අයිතමයක් නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කළ හැකි යැයි සිතන්න. ඒ අනුව B නිෂ්පාදනය වෙනුවට B-plus නිෂ්පාදනය කළ යුතුද නැද්ද යන්න තීරණය කරන්න. **(ලකුණු 09)**

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක **04**

(අ) Clario නම් උපදේශන සමාගමකට සේවාලාභියෙකු විසින් හදිසි කාර්යයක් කරන ලෙස ඉල්ලීමක් ලැබී ඇති අතර, ඒ සඳහා පහත සම්පත් අවශ්‍ය වේ.

- වර්තමානයේ පැයකට රු. 1,500/- ක අනුපාතයකින් වැටුප් ලබන සේවයේ නියුතු කාර්ය මණ්ඩල සාමාජිකයෙකු පැය 30 ක් මෙම කාර්යය සඳහා වෙන් කළ යුතුය. වෙනත් කිසිදු කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට දැනට කරගෙන යන වැඩ ආවරණය කිරීමට නොහැකි බැවින්, සමාගමට පැයකට රු. 450/- ක දායකත්වයක් (contribution) අහිමි වේ. ඊකියාවේ හදිසිභාවය නිසා, කාර්ය මණ්ඩල සාමාජිකයාට පැයකට රු. 2,000 ක අනුපාතයකින් වැටුප් ගෙවීමට සිදු වේ.
- මෙම කාර්යය සඳහා සමාගමෙහි ප්‍රධාන පරිගණක කාලය පැය 5ක් අවශ්‍ය වන අතර, එය සාමාන්‍යයෙන් සමාගම බාහිර පරිශීලකයින්ට පැයකට රු. 900/- ක අනුපාතයකට කුලියට දෙයි. මෙම ප්‍රධාන පරිගණකය දැනට දිනකට පැය 24 පුරාම, සතියේ දින 7 ම භාවිතා වේ.

අවශ්‍ය වන්නේ,

හදිසි කාර්යයට අදාළ පිරිවැය (relevant cost) තීරණය කරන්න. **(ලකුණු 10)**

(ආ) Elevex PLC යනු උපකරණ නිෂ්පාදනය කිරීමේ නිරත සමාගමකි. එම සමාගමට රු. 1,500,000 ක වටිනාකමකින් යුත් විශේෂ ඇණවුමක් ලැබී ඇත. ඇණවුම සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සම්පත් අවශ්‍ය වේ.

- රු. 500,000 ක් වටිනා අමුද්‍රව්‍ය අවශ්‍ය වේ.
- වර්තමානයේ සමාගම සතු ශ්‍රමය සමාගමේ නිත්‍ය මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සම්පූර්ණයෙන්ම යෙදී සිටින අතර, එය දැනට රු. 600 ක දායකත්වයක් (contribution) පැයකට උපයයි. මෙම විශේෂ ඇණවුම සඳහා ශ්‍රම පැය 400 ක් අවශ්‍ය වේ. මෙම විශේෂ ඇණවුම පිළිගන්නේ නම්, නිත්‍ය මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ශ්‍රම කාලය මෙම විශේෂ ඇණවුම සම්පූර්ණ කිරීම සඳහා යොමු කළ යුතුය. වර්තමානයේ සේවකයින්ට පැයකට රු. 400 ක වැටුපක් ගෙවනු ලැබේ.
- විචල්‍ය පොදු කාර්ය පිරිවැය පැයකට රු. 300 බැගින් අය කෙරේ.
- ස්ථාවර පොදු කාර්ය පැයකට රු. 300 බැගින් අවශෝෂණය කරයි. කෙසේ වෙතත්, මෙම විශේෂ ඇණවුමෙහි ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය පොදු කාර්ය පිරිවැය රු. 200,000 කින් වැඩි වනු ඇත.

අවශ්‍ය වන්නේ,

මෙම විශේෂ ඇණවුම පිළිගත යුතුද නැද්ද යන්න තීරණය කරන්න **(ලකුණු 15)**

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක **05**

(අ) Duomax PLC නම් සමාගම එකම ක්‍රියාවලියක් හරහා 'L' සහ 'K' යන ඒකාබද්ධ නිෂ්පාදන දෙකක් නිෂ්පාදනය කරයි. රු. 250,000 ක ඒකාබද්ධ සැකසුම් පිරිවැයක් බෙදුම් ලක්ෂ්‍යය දක්වා දැරීමට සිදුවන අතර, බෙදුම් ලක්ෂ්‍යයේදී L ඒකක 125,000 ක් සහ K ඒකක 75,000 ක් නිෂ්පාදනය කෙරේ. බෙදුම් ලක්ෂ්‍යයේදී විකුණුම් මිල ගණන් වනුයේ L ඒකකයකට රු. 2.00 ක් සහ K ඒකකයකට රු. 2.50 කි. L ඒකක තවදුරටත් සකස් කිරීමෙන් නව නිෂ්පාදනයක් වන 'L plus' නිෂ්පාදනය කළ හැකි නමුත්, ඒ සඳහා රු. 30,000 ක අමතර ස්ථාවර පිරිවැයක් සහ රු. 0.20 ක ඒකක විචල්‍ය පිරිවැයක් දැරීමට සිදුවේ. 'L plus' හි විකුණුම් මිල ඒකකයකට රු. 6.50 කි.

අවශ්‍ය වන්නේ,

සමාගම නිෂ්පාදනය කර අලෙවි කළ යුතු වන්නේ L ද? නොමැති නම් 'L plus' ද යන්න තීරණය කරන්න.

**(ලකුණු 10)**

(ආ) VintageVale PLC නම් වූ සමාගමෙහි 2025 පෙබරවාරි, මාර්තු, අප්‍රේල් සහ මැයි මාස සඳහා සිය මෙහෙයුම් ක්‍රියාකාරකම්වල පුරෝකථනයන් පහත දක්වා ඇත.

| | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි |
|---|---|---|---|---|
| අත්පිට විකුණුම් (රු.) | 31,300 | 32,400 | 42,500 | 52,300 |
| ණයට විකුණුම් (රු.) | 55,700 | 57,600 | 97,500 | 77,700 |

i. ණය මත විකුණන ලද භාණ්ඩ සඳහා මුදල් ලැබීම් විකුණනු ලැබූ මාසයේ එහි වටිනාකමින් 30% ක් සහ ඊළඟ මාසයේ 70% ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

ii. සමස්ත විකුණුම් වටිනාකමින් සාමාන්‍යයෙන් 60% ක් තොග මිලදී ගැනීම් ලෙස ඇස්තමේන්තු කොට ඇත. මෙම මිලදී ගැනීම් වලින් 50% ක් සඳහා මිලදී ගත් මාසයේ ගෙවනු ලබන අතර ඉතිරිය ඊළඟ මාසයේ දී ගෙවනු ලැබේ.

iii. මෙහෙයුම් වියදම් තුළ රු. 7,500 ක කාර්යයාල කුලිය ද, රු. 12,000 ක වැටුප් ද, රු. 1,500 ක උපයෝගිතා වියදම් ද අන්තර්ගත වන අතර ඒවා දරනු ලබන මාසයේදීම ගෙවනු ලබයි.

iv. 2025 මාර්තු මස ආරම්භයේ දී මුදල් ශේෂය රු. 7,500 කි.

අවශ්‍ය වන්නේ,

2025 මාර්තු සහ අප්‍රේල් යන මාස සඳහා මුදල් අයවැය සකස් කරන්න. **(ලකුණු 15)**

**(මුළු ලකුණු 25)**

**- සියලුම හිමිකම් ඇවිරිණි-**